# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 70 — 1973 ජූලි 27 වැනි සිකුරාද — 1973.07.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... | (අතිරේකයක්) | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 127 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | 129 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | | | |



## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### බස්නාහිර පළාත

✓

මහනුවර දිස්ත්‍රික් උසාවියේදීය

මහනුවර, පේරාදෙනිය පාරේ අංක 287හි පදිංචි බන්දුසේන දළුවත්ත .................... පැමිණිලිකාරයා,

නොම්මරය : ඇම්.එස්. 8822

එදිරිව

මහනුවර, මධ්‍යම වෙළඳ පොළෙහි අංක 15 පදිංචි පී. එල්. කුරුකුලසූරිය .................... විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරු පී. එල්. කුරුකුලසූරියට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් මුදලින් රු. 3,000 සමඟ 1972.06.10 දින සිට 1972.11.30 දින දක්වා ඊට නීති පොලිය ද අනතුරුව එය සම්පූර්ණයෙන් ගෙවා නිදහස්වනතුරු එකතුවන මුදලට නීති පොලියද අයකර ගැනීම සඳහා වර්ෂ 1973 ක්වූ අගෝස්තු මස 21 දින පෙ.ව. 10.30 ට පැලියගොඩ නුවර පාරේ සිසිර මෝටර්ස් ගරාජයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

අංක සම්පූර්ණ නැති අංක 24 ශ්‍රී 3398 දරණ ''ටොයොටා'' වර්ගයේ ඩීසල් ලොරිය ... ... 1යි

එම ලොරියට අයිති කොටස්—

1. ඉදිරි බෆර් ... ... ... 1යි
2. බොනට් උඩකොටස් ... ... 1යි
3. ඉදිරි හෙඩ් ලයිට් සමග මඩිගාඩ් ... ... 2යි
4. ෂොක් ඇබසෝබර්ස් ... ... 2යි
5. ඉදිරි දුනු සෙට් ... ... ... 2යි
6. ඉදිරි ටයර් එක රිම් එක සමඟ ... ... 1යි
7. ස්ටීරියන් වීල් 1 එම ස්ටීරියන් බොක්ස් ... 1යි
8. ඩීසල් ටැන්කි ... ... ... 1යි
9. පිටුපස පාවිච්චිකළ ටයර් (ටොයොටා වර්ගය) ... 2යි
10. ස්පෙයා වීල් ... ... ... 1යි
11. පිටුපස දුනු සෙට් ... ... 2යි
12. සෙන්ට්‍රල් ජොයින්ට් ... ... 1යි
13. පිටුපස වම් ඩ්‍රම් (වීල් ඩ්‍රම්) ... ... 1යි
14. ගලවන ලද රේඩියේටර් ... ... 1යි
15. මඩිගාඩ් වැලන්ස් ... ... ... 2යි
16. නොගලවන ලද ගියර් බොක්ස් ... ... 1යි
17. ඇන්ජින් බොලොක් ... ... ... 1යි
18. කැන්ක් ෂාෆ්ට් ... ... ... 1යි
19. හෙඩ් එක කොටස් (ඇන්ජිම) ... ... 2යි
20. ටැෆ්ට් කවර් හවුසින් — පලු ... ... 2යි
21. ෆ්ලයි වීල් ... ... ... 1යි
22. ෆ්ලයි වීල් හවුසින් ... ... ... 1යි
23. වෝටර් පෑන් ... ... ... 1යි
24. ටයිමින් කේස් හවුසින් ... ... 1යි
25. ඉදිරි සෙල් ... ... ... 1යි
26. රේඩියේටර් බ්‍රකට් ... ... ... 1යි
27. එයාර් ක්ලීනර් ... ... ... 1යි
28. ගියර් හැන්ඩල් ... ... ... 1යි
29. සම්ප් ... ... ... 1යි
30. ඉන්ජෙක්ටර් පොම්ප... ... ... 1යි
31. ඉන්ජෙක්ටර්ස් ... ... ... 6යි
32. ගලවා තබා ඇති ටයර් ... ... 3යි

ඩබ්ලිව්. ජේ. ඩයස්,
කොළඹ නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1973 ජූලි මස 19 දින,
කොළඹ පිස්කල් කන්තෝරුවේදිය.

7–1091—73.07.27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළු දෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

කුරුණෑගල දිසා අධිකරණයේ දීය

ඔඩර් නයිසයි නියෝගයයි

වාරියපොල සියඹලා වැවේ පදිංචි ලංසකාර මුදියන්සේලාගේ විකිරි බංඩා .................................................. පෙත්සම්කරු.

බුදල් නඩු අංකය : 6365/ටී එදිරිව

වාරියපොල සියඹලා වැවේ පදිංචි කාරයන් වන 1. අබේරත්න ජයසුන්දර මුදියන්සේලාගේ මුතු මැණිකා, 2. ලංසකාර මුදියන්සේලාගේ සිරිසේන, 3. ලංසකාර මුදියන්සේලාගේ ජයතිලක, 4. ලංසකාර මුදියන්සේලාගේ අබේරත්න, 5. ලංසකාර මුදියන්සේලාගේ ජයසුන්දර, 6. ලංසකාර මුදියන්සේලාගේ ජයරත්න, 7. ලංසකාර මුදියන්සේලාගේ ඩිංගිරි මැණිකා, 8. ලංසකාර මුදියන්සේලාගේ ගුණරත් මැණිකා, 9. ලංසකාර මුදියන්සේලාගේ ඩිංගිරි අම්මා............වගකියන්නෝ.

සියඹලා වැවේ පදිංචිව සිට නැසීගිය ලංසකාර මුදියන්සේලාගේ පුංචි බංඩාගේ බුදලය සම්බන්ධවයි......................නැසීගිය අය.

මෙම කාරනාව වර්ෂ 1973 ජනවාරි මස 24 වැනි දින කුරුණෑගල දිසා විනිසුරු ඇම්. ඇම්. අබ්දුල් කාදර් මහතා ඉදිරිපිට තීරණයට පැමිණ ඉහතකී පෙත්සම්කරු වෙනුවෙන් කේ. අයි. ජී. ඇල්. ඩබ්ලිව්. පෙරේරා නීතිඥ මහතා පෙනී සිටියදී ඉහතකී පෙත්සම්කරුගේ 1973 ජනවාරි මස 24 වෙනි දින දරණ දිව්රුම් පෙත්සමක් කියවා බලා තීරණය කරන්නට යෙදුනේ නම් :

1973 අගෝස්තු මස 7 වෙනි දිනට හෝ ඊට පෙර වගකියන්නන් විසින් හෝ මෙම බුදලයට සම්බන්ධ හිමිකම් ඇති වෙනත් අයෙක් හෝ අයවලුන් විසින් මෙම අධිකරණයට ඒත්තු ගන්නාකාර සැහෙන විරුද්ධ කාරනා නොපෙන්වා සිටියොත් ඉහතකී පෙත්සම්කරු නැසී ගිය අයගේ වැඩිමහල් පුත්‍රයා හැටියට ඔහුගේ බුදලයේ අද්මිනිස්ත්‍රාසි බල පත්‍රය ලැබීමට නියි අය බව තීරණය කරන්නට යෙදෙන බවය.

තවද වැඩිදුරටත් තීරණය කරන්නට යෙදුනේ නම් ඉහතකී වගකියන්නන් විසින් හෝ මෙයට හිමිකම් ඇති වෙනත් අයෙක් හෝ අයවලුන් විසින් 1973 අගෝස්තු මස 7 වෙනි දිනට හෝ ඊට පෙර මෙම අධිකරණයට ඒත්තු යනාකාර විරුද්ධ කාරණා නොපෙන්වා සිටියොත් ලාබාල 4 වෙනි සහ 5 වෙනි සහ 6 වෙනි වගකියන්නන්ගේ බාරකාරයා හැටියට ඔහුගේ මව් වන පලවෙනි වගකියන්නී පත් කරණ බවය.

ඇම්. ඇම්. අබ්දුල් කාදර්,
දිසා විනිසුරු.

1973 ජනවාරි මස 24 වෙනි දින දීය.

7-917—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පලකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පලකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.29 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.06 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.13 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.20 | සිකුරාද | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 මැයි මස 04 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.